)වියදුහි ඇඩවිලුදි විඩ්රිමිවි
All Rights Reserved

## අවසාන වාර පරීක්ෂණය 2015

# බුද්ධ ධර්මය - I

**11 ශ්‍රේණිය** **කාලය පැය 1 යි.**

| නම/ විභාග අංකය: |
|---|

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- වඩාත් ම නිවැරදි පිළිතුර තෝරන්න.

01 සිදුහත් කුමරු සතර පෙර නිමිති දැකීම යන්නෙන් අදහස් වන සැබෑ අරුත වන්නේ,
(1) පුද්ගලයන් සතර දෙනෙකු ශාරීරික වශයෙන් දැකීමයි.
(2) මිනිස් වෙස්ගෙන දෙව්ලොවින් පැමිණි සිවුදෙනෙකු දැකීමයි.
(3) ඉපදීම, වයසට යාම ආදී ජීවිතයේ යථාර්ථ ලක්ෂණ අවබෝධ වීමයි.
(4) අනාගතය සාර්ථක වන බවට ඉඟි කෙරෙන දසුන් නෙත ගැටීමයි.

02 සිදුහත් බෝසතාණන්ට බුදුවීමෙන් පසු පළමු දානය පිළිගැන්වූයේ,
(1) සුජාතා සිටුදේවියයි. (2) තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයන් ය.
(3) චුන්ද කම්මාර පුත්‍රයා ය. (4) බිම්බිසාර රජතුමා ය.

03 සිදුහත් කුමරා මතු බුදුවන බව ස්ථිර වශයෙන්ම ප්‍රකාශ කළේ,
(1) අසිත තවුසා ය. (2) කොණ්ඩඤ්ඤ තවුසා ය.
(3) සුමේධ තවුසා ය. (4) නාරද තවුසා ය.

04 ''දහම් ඇසීමට කැමැති වීම, සිල්වතුන් දැකීමට කැමැති වීම, භික්ෂූන්ට ගෞරව දැක්වීම'' මෙම ගතිලක්ෂණ ඇත්තා තුළ
(1) විමර්ශනශීලී බව දැකිය හැකි ය. (2) තාර්කික බව දැකිය හැකි ය.
(3) ගතානුගතික බව දැකිය හැකි ය. (4) ශ්‍රද්ධාවන්ත බව දැකිය හැකි ය.

05 බෝසතුන්ගේ වීර්ය පාරමිතාවට උදාහරණ වශයෙන් දැක්විය හැකි ජාතක කථාව
(1) මඛාදේව ජාතකයයි. (2) වණ්ණුපථ ජාතකයයි.
(3) උම්මග්ග ජාතකයයි. (4) තේමිය ජාතකයයි.

06 බුදුන්වහන්සේ නව මානව වංශයක් ආරම්භ කළේ යයි පසුකාලීන වියතුන් අතරින් ප්‍රකාශ කළේ,
(1) මන්මථනාත් ශාස්ත්‍රී ය. (2) එච්. ජී. වේල්ස් ය.
(3) ජවහර්ලාල් නේරු තුමා ය. (4) සර්වපල්ලි රාධක්‍රිෂ්ණන් ය.

07 සිදුහත් කුමාරයා ගිහිගෙය අතහැර දමා පැවිදි වී මුලින් ම ගියේ
(1) කාලදේවල නම් තවුසා වෙත ය. (2) භාර්ගව නම් ආචාර්යවරයා වෙත ය.
(3) ආලාර කාලාම නම් තවුසා වෙත ය. (4) පස්වග තවුසන් වෙත ය.

08 ''උට්ඨානවතො සතිමතො'' යන ගාථාව අයත් වන්නේ ධම්ම පදයේ
(1) අප්පමාද වග්ගයට ය. (2) බාල වග්ගයට ය.
(3) යමක වග්ගයට ය. (4) බුද්ධ වග්ගයට ය.

09 ''දොහොත් මුදුන් දී නමස්කාර කිරීමට සුදුසු'' යන සඟ ගුණය ප්‍රකාශ වන පාලි පාඨය වන්නේ,
(1) ආහුණෙය්‍යා යන්නයි. (2) පාහුණෙය්‍යා යන්නයි.
(3) දක්ඛිණෙය්‍යා යන්නයි. (4) අංජලි කරණීය යන්නයි.

10 ඊළඟ භවයෙහි ඒකාන්තයෙන්ම විපාක දෙන කර්මය
(1) ගරුක කර්මයයි. (2) ආසන්න කර්මයයි.
(3) ආචිණ්ණ කර්මයයි. (4) කටත්තා කර්මයයි.

11 තමන්වහන්සේගේ රූපය දෙසම බලමින්, ඒ ගැනම සිතමින් සිටි වක්කලී හිමියන් අමතා බුදුන්වහන්සේ දේශනා කළේ,

(1) ''යමෙක් ගිලනුන්ට උපස්ථාන කරයිද හෙතෙම මට උපස්ථාන කරයි.''

(2) ''යමෙක් ධර්මය දකීද හේ මා දකියි.''

(3) ''යමෙක් මෛත්‍රිය වඩයි ද හෙතෙම සුගතියෙහි උපදියි.''

(4) ''යමෙක් අකුසල් සිදුකරයිද හෙතෙම අපායෙහි උපදියි''

12 සිදුහත් බෝසතාණන් සම්පූර්ණ කළ දස පාරමිතා තුන් ආකාරයකින් බෙදා දක්වා තිබේ. ඒවා නම්,

(1) සීල, සමාධි, පඤ්ඤා වශයෙනි.

(2) සාවක බෝධි, පච්චේක බෝධි, සම්මා සම්බෝධි වශයෙනි.

(3) පාරමී, උප පාරමී, පරමත්ථ පාරමී වශයෙනි.

(4) දාන, ශීල, භාවනා වශයෙනි.

13 ''මහණෙනි, බොහෝ දෙනාට හිත සුව පිණිස චාරිකාවේ හැසිරෙන්න.'' බුදුන් වහන්සේ මෙම ප්‍රකාශය කළේ,

(1) පස්වග මහණුන්ට ය. (2) යසකුල පුත්‍රයා ඇතුළු පිරිසට ය.

(3) උරුවෙල් කාශ්‍යප ඇතුළු පිරිසට ය. (4) මුල්ම රහත් සැට නමට ය.

14 බිම්බිසාර රජතුමා බුදුරදුන්ට පූජා කළ ආරාමය

(1) ජේතවනාරාමයයි. (2) වේළුවනාරාමයයි.

(3) පූර්වාරාමයයි. (4) න්‍යග්‍රෝධාරාමයයි.

15 මෛත්‍රී වැඩීමෙන් ලැබෙන ආනිසංස ගණයට ඇතුළත් නොවන කරුණ වන්නේ,

(1) නපුරු සිහින නොදැකීම.

(2) දෙවියන් විසින් රකිනු ලැබීම.

(3) ගින්නෙන්, විසෙන්, ආයුධ වලින් හානි නොවීම.

(4) සිහි මුලාවී කලුරිය කිරීම.

16 කුසල් කිරීමට මුල්වන චේතනා තුන වන්නේ,

(1) ලෝභ, දෝස, මෝහ (2) අලෝභ, අදෝස, අමෝහ

(3) සිත, කය, වචනය (4) දාන, ශීල, භාවනා

17 නීවරණ අතරට ගැනෙන සිතේ උදාසීන ගතිය හෙවත් චෛතසිකයන්ගේ අලස ගතිය

(1) ව්‍යාපාද නම් වේ. (2) උද්ධච්ච, කුක්කුච්ච නම් වේ.

(3) ථීන මිද්ධ නම් වේ. (4) විචිකිච්චා නම් වේ.

18 කාමයෙන්, හිංසනයෙන් හා දැඩි ක්‍රෝධයෙන් බැහැර වීම අරි අටඟ මගෙහි හැඳින්වෙන්නේ,

(1) සම්මා දිට්ඨි යනුවෙනි. (2) සම්මා සංකප්ප යනුවෙනි.

(3) සම්මා වායාම යනුවෙනි. (4) සම්මා සති යනුවෙනි.

19 ගවයා පසුපස යන රිය සක මෙන් පුද්ගලයාට දුක ගෙන දෙමින් ඔහු පසු පස දුක ගමන් කරන්නේ ඔහු සිදුකළ

(1) අකුසල කර්ම විපාක නිසාය. (2) කුසල කර්ම විපාක නිසාය.

(3) අචේතනික කර්ම විපාක නිසාය. (4) අහේතුක කර්ම විපාක නිසාය.

20 ''සමාජයේ සෙසු පුද්ගලයන් අකුශල ධර්මයන්ගෙන් අපිරිසිදුව සිටියද අපි ඒවායින් වැළකී පිරිසිදු සිතින් වාසය කළ යුත්තෙමුයි යන ප්‍රතිපත්තිය

(1) මධ්‍යම ප්‍රතිපදාවයි. (2) සල්ලේඛ ප්‍රතිපදාවයි.

(3) අත්තුපනායික ප්‍රතිපදාවයි. (4) කුසලාකුසල ප්‍රතිපදාවයි.

21 පංචස්කන්ධය, අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් ප්‍රඥාවෙන් දකිමින් කරනු ලබන භාවනාව

(1) ස්කන්ධ භාවනාවයි. (2) සමථ භාවනාවයි.

(3) විදර්ශනා භාවනාවයි. (4) මෛත්‍රී භාවනාවයි.

22 බුදුන් වහන්සේගේ දේශනාව අනුව දිවා රාත්‍රී පින් වැඩෙන කුශල ක්‍රියා ගණයට අයත් නොවන්නේ,

(1) මල්, පලතුරු උයන් වගා කිරීම. (2) ස්වභාවික වනාන්තර ආරක්ෂා කිරීම.

(3) ඒදඬු, පාලම්, පොකුණු තැනීම. (4) තෝරාගත් වෘක්ෂ වන්දනා කිරීම.

23 මානසික වශයෙන් නිරෝගී වීම සඳහා ඉවහල්වන කායානුපස්සනා, වේදනානුපස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා යන සතර

(1) අසුභ භාවනා නමින් හැඳින්වේ.

(2) චතුරාරක්ඛා භාවනා නමින් හැඳින්වේ.

(3) සතිපට්ඨාන භාවනා නමින් හැඳින්වේ.

(4) කර්මස්ථාන භාවනා නමින් හැඳින්වේ.

24 සිඟාලෝවාද සූත්‍රයේ දී පුද්ගලයා ඉපයූ ධනය විනාශ වන දොරටු හයක් දේශනා කළ අතර ඊට අයත් නොවන කරුණ වන්නේ,

(1) මත්පැන් පානයයි. (2) නොකල්හි වීදි සංචාරයයි.

(3) සූදුවට ලොල්වීමයි. (4) අනලස් බවයි.

25 ''ඉමස්මිංසති ඉදං හෝති ඉමස්මිං අසති ඉදං න හෝති'' ''මෙය ඇතිකල්හි මෙය වේ. මෙය නැති කල්හි මෙය නොවේ'' ආදී වශයෙන් අදාළ හේතු සාධක පවත්නා කල්හි ඵලයක් ඇති වීම බුදු දහමේ විග්‍රහ වන්නේ,

(1) පටිච්ච සමුප්පාදය තුළිනි. (2) අහේතුක වාදය තුළිනි.

(3) කර්ම වාදය තුළිනි. (4) හේතුවාදය තුළිනි.

26 මෙත් වැඩීම ආරම්භ කරන පුද්ගලයා ඇතිකරගත යුතු යැයි කරණීය මෙත්ත සූත්‍රයේ දී දේශනා කළ ගුණාංග අතර ලද දෙයින් සතුටු වීම

(1) අනතිමානී නමින් හැඳින්වේ. (2) සන්තුස්සකො නමින් හැඳින්වේ.

(3) අප්ප කිච්චො නමින් හැඳින්වේ. (4) සන්තින්ද්‍රියෝ නමින් හැඳින්වේ.

27 අඹ ඇටයක් පැල කළ විට අඹ පැලයක්ම ලැබෙනුයේ කිසිවකුගේ මැදිහත්වීමකින් නොව හේතු ප්‍රත්‍ය අනුරූපවය. ධර්මයේ මෙය හඳුන්වන්නේ,

(1) උතු නියාම යනුවෙනි. (2) බීජ නියාම යනුවෙනි.

(3) ධම්ම නියාම යනුවෙනි. (4) චිත්ත නියාම යනුවෙනි.

28 පළමුවැනි ධර්ම සංගායනාවේ දී ධර්ම විනය මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන යාමට භික්ෂූන්ට පවරනු ලැබූ අවස්ථාවේ දී සැරියුත් හිමියන්ගේ ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරාවට පවරනු ලැබුයේ,

(1) දීඝ නිකායයි. (2) මජ්ඣිම නිකායයි.

(3) සංයුක්ත නිකායයි. (4) අංගුත්තර නිකායයි.

29 තෙවැනි සංගායනාවේ ප්‍රතිඵල ගණයට අයත් නොවන කරුණ වන්නේ,

(1) දුසිල් මහණුන් සසුනින් නෙරපීම යන්නයි.

(2) නවරට පිහිටුවීම යන්නයි.

(3) දසවස්තු ප්‍රතික්ෂේප වීම යන්නයි.

(4) කථාවත්ථුප්පකරණය සම්පාදනය යන්නයි.

30 ධාර්මික රාජ්‍ය පාලනයක් සඳහා උපදෙස් ලබාදෙන කරුණු අතරට අයත් නොවන්නේ,

(1) සප්ත අපරිහානිය ධර්ම යන්නයි. (2) දස සක්විති යන්නයි.

(3) දස රාජ ධර්ම යන්නයි. (4) සතර උපාදාන යන්නයි.

31 ''සබ්බේ මනුස්සා මම පජා'' ''සියලු මිනිස්සු මගේ දරුවෝ ය.'' යන ප්‍රතිපදාව මුල්කොට ගෙන තම රාජ්‍ය පාලනය ගෙන ගිය රජතුමා

(1) බිම්බිසාර රජු (2) අජාසත් රජු (3) අශෝක රජු (4) කොසොල් රජු

32 කෝට්ටේ යුගයේ විසූ තොටගමුවේ රාහුල හිමියන් කාව්‍ය ශේඛරය ලිවීමට පාදක කොටගත් ජාතක කථාව වන්නේ,

(1) සත්තුභත්ත ජාතකයයි. (2) මඛාදේව ජාතකයයි.

(3) සස ජාතකයි. (4) ලෝමහංස ජාතකයයි.

33 සප්ත අපරිහානීය ධර්මවලට අයත් නොවන කරුණ වන්නේ,

(1) නිතර රැස්වීම යන්නයි.

(2) සමගිව රැස්ව සමගිව විසිර යාම යන්නයි.

(3) පෙර නොපැනවූ නීති පැනවීම යන්නයි.

(4) කාන්තාවන්ට ආරක්ෂාව සැලසීම යන්නයි.

34 වළගම්බා රජතුමා තමන්ට උපකාර කළ මහා තිස්ස හිමියන්ට අභයගිරි විහාරය කරවා පෞද්ගලිකව පූජා කිරීම නිසා ලංකා ශාසන ඉතිහාසයේ සිදුවූ වැදගත්ම ශ්‍රී ලාංකීය කරුණ නොවන්නේ,

(1) පිරිස කොටස් දෙකකට බෙදීයාමයි.

(2) භික්ෂුවක සංඝ සමාජයෙන් ඉවත් කිරීමයි.

(3) මහා විහාරයට රාජානුග්‍රහය නොලැබී යාමයි.

(4) විනය සංගායනාවක් සිදුවීමයි.

35 සදුපදේශ ලබාදීමේ අරමුණින් ලියූ උපදේශ කාව්‍ය ග්‍රන්ථ තුනක් වන්නේ,

(1) ලෝකෝපකාරය, කාව්‍යශේඛරය හා කව්සිළුමිණ යන්නයි.

(2) ලෝවැඩ සඟරාව, සසදාවත හා බුදුගුණාලංකාරය යන්නයි.

(3) ලෝවැඩ සඟරාව, සුභාෂිතය හා ලෝකෝපකාරය යන්නයි.

(4) ලෝවැඩ සඟරාව, සිදත් සඟරාව හා ගුත්තිලය යන්නයි.

36 රාජ්‍ය පාලනයට අදාළ වන ''සප්ත අපරිහානීය ධර්ම'' අනුගමනය කළ බුද්ධකාලීන රාජ්‍ය වූයේ,

(1) වජ්ජි රාජ්‍යයයි. (2) කෝසල රාජ්‍යයයි.

(3) මගධ රාජ්‍යයයි. (4) කාසි රාජ්‍යයයි.

37 පැරණි ලංකාවේ කුඩා ප්‍රමාණයේ ස්තූපවල ආරක්ෂාව සඳහා එය මැදිකොට ඉදිකරනු ලැබූ ගොඩනැගිල්ල හඳුන්වනු ලැබූයේ,

(1) පටිමාඝර නමිනි. (2) චේතියඝර නමිනි.

(3) බෝධිඝර නමිනි. (4) පධානඝර නමිනි.

38 ''මගේ රට, මගේ ජාතිය, මගේ ආගම, මගේ භාෂාව කියා වටිනා රත්න හතරක් මට තියනවා. ඒ රත්න හතර ආරක්ෂා කර ගැනීම මගේ යුතුකමයි.'' මෙසේ ප්‍රකාශ කළේ,

(1) අනගාරික ධර්මපාල තුමා (2) සර් හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා

(3) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි (4) වලිසිංහ හරිස්චන්ද්‍ර තුමා

39 ශ්‍රී ලංකාවේ දැනට ශේෂව ඇති ඉපැරණිම විහාර බිතු සිතුවම් ඇත්තේ,

(1) සීගිරියේ පිදුරංගල විහාරයේ ය. (2) ගඩලාදෙණි විහාරයේ ය.

(3) පොළොන්නරුවේ තිවංක පිළිමගෙහිය. (4) ලංකාතිලක විහාරයේ ය.

40 හිටි පිළිම, හිඳි පිළිම, සැතපෙන පිළිම යන තුන් ඉරියව්වෙන්ම වැඩසිටින පිළිම දක්නට ලැබෙන්නේ,

(1) මාලිගාවිලය

(2) තන්තිරිමලේය

(3) පොළොන්නරුවේ තිවංක පිළිමගෙහිය

(4) පොළොන්නරුවේ ගල් විහාරයෙහිය

)විශ්ම ඇවිලු!දි ටිචිරිමිපි
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

**11 ශ්‍රේණිය** | **බුද්ධ ධර්මය - II** | **කාලය පැය 2 යි.**

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරාගත් අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ. ((1) - ලකුණු 02 (2) - ලකුණු 03 (3) - ලකුණු 05 වශයෙනි.)

01 (1) ජේතවනාරාමය සහ පූර්වාරාමය යන ආරාම ඉදිකොට බුදුන් වහන්සේට පූජා කරනු ලැබුවේ කවුද?
(2) භික්ෂු ජීවිතය පවත්වා ගැනීමට අවශ්‍ය මූලික කරුණු හතරක් සිවුපසය නමින් බුදු දහමෙහි පෙන්වා දී ඇත. එම කරුණු මොනවා ද?
(3) ''යෝ ධම්මං පස්සති සෝ පටිච්ච සමුප්පාදං පස්සති'' මෙම පාඨයෙන් ප්‍රකට කෙරෙන ධර්ම කරුණ කුමක් ද?
(4) ධාර්මික රාජ්‍ය පාලනයක් සඳහා අවශ්‍ය වන ගුණ ධර්ම හතරක් සතර සංග්‍රහ වස්තු ලෙස දක්වේ. එම ගුණ ධර්ම හතර නම් කරන්න.
(5) යමෙක් වැරදි තීරණ ගැනීමට පොළඹවන අගතිගාමී විය හැකි කරුණු හතරක් ධර්මයේ ඉගැන්වේ. සතර අගති යනු ඒවාය. එම කරුණු හතර ලියන්න.
(6) බුදුරජාණන් වහන්සේගේ ''පුරිසදම්මසාරථී'' ගුණය විස්තර කරමින් බුද්ධ චරිතය පසුබිම්කොට පොළොන්නරු යුගයේ ලියවුණු ගද්‍ය කෘතිය හා එහි කතුවරයා නම් කරන්න.
(7) ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රිවිධ ශික්ෂාවට බෙදීමේදී ප්‍රඥාවට අයත් මාර්ගාංග දෙක දක්වන්න.
(8) මාතලේ අළු විහාරයේ දී පවත්වන ලද සිව්වැනි ධර්ම සංගායනාවෙන් සිදුවූ වැදගත්ම ශාසනික ප්‍රතිඵලය කුමක් ද?
(9) අනවජ්ජ සුඛ කෙටියෙන් පහදන්න.
(10) වටදාගෙය කෙටියෙන් හඳුන්වන්න.

02 (1) බුදුරජාණන් වහන්සේගේ චරිතයෙන් ප්‍රකට කෙරෙන ආදර්ශ දෙකක් දක්වන්න.
(2) ඉහත ආදර්ශවලින් එකක් ප්‍රකට වූ අවස්ථාවක් කෙටියෙන් දක්වන්න.
(3) පුද්ගල චරිතයක් ශ්‍රේෂ්ඨත්වයට පත්කර ගැනීමට ඔබ දක්වූ ආදර්ශ ඉවහල්වන අයුරු පෙන්වා දෙන්න.

03 (1) මෙත් වැඩීමේ ආනිශංස අතුරෙන් දෙකක් දක්වන්න.
(2) කරණීයමෙත්ත සූත්‍රයේ දැක්වෙන පරිදි අසීමිතව (අපරිමාණං) මෛත්‍රිය වඩන ආකාරය පැහැදිලි කෙරෙන උපමාව දක්වන්න.
(3) මෛත්‍රිය වැඩීම පිළිබඳව කරණීයමෙත්ත සූත්‍රයෙහි දක්වා ඇති ආකාරය පැහැදිලි කරන්න.

04 (1) තෙරුවන නම් කරන්න.
(2) ත්‍රිවිධ චෛත්‍ය ලියන්න.
(3) දිනපතා ඉගනීමේ කටයුතු ආරම්භ කිරීමට පෙර තෙරුවන් නැමදීමෙන් හා මෙත් වැඩීමෙන් බෞද්ධ ශිෂ්‍යයාට ලැබෙන මානසික සහනය පැහැදිලි කරන්න.

05 (1) චතුරාර්ය ධර්ම අතුරෙන් දෙකක් ලියන්න.
(2) ''මධ්‍යම ප්‍රතිපදාව'' යන්න පැහැදිලි කරන්න.
(3) පුද්ගලයාට සදාචාර ජීවිතයක් ගතකිරීමට ආර්ය අෂ්ටාංගික මාර්ගය අදාළ කරගත හැකි ආකාරය පහදන්න.

06 (1) සියලු පව් නොකළ යුතු යැයි සඳහන් බුදුවරුන්ගේ අනුශාසනා දැක්වෙන ධම්ම පද ගාථාව ලියන්න.
(2) සිත පිරිසිදු කිරීම යන්නෙහි සරල අදහස දක්වන්න.
(3) පුද්ගලයකුගේ කායික සංවරය හෙවත් කයෙන් සිදුවන අකුසල් වලින් මිදීමෙන් ප්‍රීතිමත් සමාජයක් ගොඩනැගීමට හැකිවන ආකාරය විස්තර කරන්න.

07 (1) ස්තූප ආකෘති හයෙන් දෙකක් නම් කරන්න.
(2) රුවන්වැලි සෑය, අභයගිරිය, ජේතවනාරාමය ගොඩනැගූ පාලකයින් නම් කරන්න.
(3) සර්වඥයන් වහන්සේගේ ශාරීරික ධාතු වන්දනාව උදෙසා ශ්‍රී ලාංකේය බෞද්ධයන් දක්වූ උනන්දුව හා සැලකිල්ල නිදසුන් මගින් පෙන්වා දෙන්න.